හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------- |
| (i) | වර්ෂයේ අවසන් මාස 03 සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට පෙර අදාළ ආයතනවලින් තොරතුරු ලබාගත යුතුවේ. | පිළිගනිමි. ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට පෙර අදාළ ආයතනවලින් තොරතුරු ලබාගත යුතුවේ. | පිළිගනිමි. ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ගලි රථ ආදායම රු.1,035,050 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සැසඳීම් කර නිවැරදි කරගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවක ණය කේවල ගිණුම් වාර්තාව අනුව ශේෂය 4,072,975 ක් වන අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.3,966,226 ක් වුයෙන් රු.106,749 ක වෙනසක් පැවතුණි. | සැසඳීම් කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | හිග හිටි වරිපනම් මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.2,676,692 ක් වන අතර උපලේඛන අනුව වටිනාකම රු.2,915,837 ක් වුයෙන් 239,145 ක වෙනසක් පැවතුණි. | සැසඳීම් කර නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | ගිණුම් ශේෂ 05 ට අදාලව ප්‍රා.ස 04 ලැබීම් විශ්ලේෂණය හා ආදායම් ප්‍රකාශනය අතර රු.16,966,269 ක වෙනසක් පැවතුණි | වෙනසට තුඩුදුන් හේතු ලෙජර් ගිණුම් හා ජ'නල් සටහන් මගින් අනාවරණය කල යුතුවේ. | ජ'නල් සටහන් මගින් ගැලපීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.433,434,124ක් වූ ගිණුම් විෂයයන්/ගණුදෙනු 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම්වල අයිතිය බිම් සවිය ව්‍යාපෘතිය යටතේ ලබාගැනීමට ඉල්ලීම් කර ඇත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ වර්ෂ 02 ත් 10 ත් අතර කාලයකට අයත් රු.4,019,598 ක ගෙවිය යුතු ගිණුම් ශේෂය නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | ශේෂවල නිවැරදිභාවය තහවුරු කරගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ii) | මූල්‍ය ප්‍රකාශන වල 2016 වර්ෂයේ සිට පෙන්වා තිබූ රු.6,725,164 ලැබිය යුතු ගිණුම් ශේෂය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානය යොමු කර නොතිබුණි. | හඳුනාගෙන අයකර ගැනීමට හෝ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට අවධානය යොමු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම.

නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | | |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල්වල හා පටුමාවත්වල ස්ථිර සලකුණු හා සීමා ලකුණු කිරීම සැලැස්ම පිළියෙළ කිරීම හා ඒවායේ නාමලේඛනයන් දක්වමින් දැන්වීම් පල කිරීම සිදුකර නොතිබුණි | අදාළ ලේඛන සකස් කළ යුතුවේ. | පිළිගනිමි. දැනට ඒ අනුව කටයුතු කරමින් පවතින බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 126 වගන්තිය | රථගාල් වලින් ගාස්තු අයකිරීම,සතිපොළ බදු හා ජල ගාස්තු සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නියමිත ආදායම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නියමිත ගාස්තු අයකළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් අයකිරීමට කටයුතු කරමි. |
| (iii) | 134 වගන්තිය | වරිපනම් අය කිරීම සඳහා කලින් කල දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ දිනවල සමීක්ෂණය සිදුකරමින් පවතින බව දන්වමි. |
| (iv) | 135 වගන්තිය | වරිපනම් බදු නිදහස් දේපළ ලැයිස්තුවක් පිළියෙළ කර නොතිබුණි. | බදු නිදහස් දේපල ලැයිස්තු පිළියෙල කළ යුතුවේ. | පිළියෙල කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන)රීති<br>-------------------------------- | | | |
| (i) | රීති අංක 59 සිට 63 දක්වා | සෑම වර්ෂයක් ආරම්භයේදීම බල ප්‍රදේශය තුළ පවතින කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණු අතර කර්මාන්ත බදු ගෙවන ලෙස නිවේදන යවා | රීති උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) | රීති අංක 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂාවක් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන් වෙනුවෙන් සිදුකර නොතිබණි | වාර්ෂිකව සමීක්ෂණ කටයුතු සිදුකල යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතනසංග්‍රහයේ xxivපරිච්ඡේදයේ 10 වන වගන්තිය | ස්ථාන මාරු වී පැමිණි නිළධාරීන් 11 කගේ රු.804,495 ක් හා ස්ථාන මාරු වී ගිය නිළධාරීන් 10 කගේ රු.955 199 ක ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහය අනුව නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලබා දී නැත. |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 අප්‍රේල් 20 දිනැති අංක 88/20 චක්‍රලේඛය 01 ඡේදය | වර්ෂ 10 කට අධික කාලයක සිට බැංකු සැසඳුම්වල අතැති මුදල් ලෙස දක්වා තිබූ 64,291 ක මුදල හා තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් යටතේ දක්වා තිබූ රු.51,490 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලබා දී නැත. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයසඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.5 ,981, 895 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8, 816,876 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කල ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්
---------------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| (i) | වරිපනම් හා බදු | 4,894,500 | 4,798,892 | 4,327,291 | 3,202,983 | 4,582,000 | 5,519,268 | 4,696,067 | 3,101,407 |
| (ii) | කුලී | 11,670,300 | 34,597,270 | 10,355,060 | 11,546,765 | 3,494,480 | 9,947,164 | 5,545,639 | 11,521,830 |
| (iii) | බලපත්‍ර ගාස්තුව | 2,755,000 | 2,991,261 | 2,991,261 | - | 3,000,000 | 3,066,025 | 3,066,025 | - |
| (iv) | වෙනත් ආදායම් | 18,625,000 | 17,742,991 | 31,385,625 | 17,742,917 | 8,100,000 | 6,764,379 | - | 41,671,796 |
| | | 37,944,800 | 60,130,414 | 49,059,237 | 32,492,665 | 19,176,480 | 25,296,836 | 13,207,731 | 56,295,033 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් රු.37,944,800 ක ආදායමක් ඇස්තමේන්තුකරතිබුණු අතර රැස්කර තිබූ ආදායම රු.49,059,238 ක් විය.සමාලෝචිත වර්ෂයේදී රැස්කළ ආදායම ඇස්තමේන්තුගතආදායම ඉක්මවීමට ප්‍රධාන වශයෙන් ඉකුත් වර්ෂ වලට අදාළ උසාවි දඩආදායම් රු.31, 385, 626 ක් සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත ලැබීම හේතු වී තිබුණි. | ආදායම් නිවැරදිව ඇස්තමේන්තු කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 කට වරක් වරිපනම් තක්සේරු කළ යුතු වුවද 2005 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව වරිපනම් ගාස්තු අයකර තිබූ | වසර 05 කට වරක් වරිපනම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතු අතර හිඟ ආදායම් අයකිරීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ. | 2013 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව සිදුකල |

| | | |
|---|---|---|
| අතර 2018 දෙසැම්බර් 31 දින වන විට සභාවේ හිග හිටි වරිපනම් බදු ආදායම් රු.2,676,692 ක් විය. | | තක්සේරු වාර්තාව ලබාදී නැත. ඉදිරියේදී නව තක්සේරුවක් කිරීමට කටයුතු කරමි. |

2.2.4 කුලී
------

(අ) කඩ කුලී
--------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිග කඩ කුලී ආදායම 8,911,749 ක් වූ අතර හිග අයකරගැනීම සඳහා කුලී ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම මෙම හිගය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. හිඟ කඩ කුලී මුදල් ගෙවීම් නොකල කඩ හිමියන් සඳහා කුලී ගිවිසුම් ප්‍රකාරව කඩ කාමර මුද්‍රා තැබීමට කටයුතු සිදුකරමි. |

2.2.5 වෙනත් ආදායම්
----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් වාහන හා යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් සභාව වෙත වසර 1-6 ත් අතර කාල පරාසයක සිට රු 9,631,459 ක මුදලක් හිග හිටව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | රු.405,650 ක් විමධ්‍යගත මුදල් මඟින් අය කිරීමට ඇත. ඉතිරි මුදල් සඳහා |

සිහිකැඳවීම්
යවා ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුවහා සුබසාධනය හා සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 27 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින පැවති කාරණා 10 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කල යුතුවේ. | අනෙකුත් කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. |

(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදය

----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභා විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 04 ක් ඉටුකිරීම සඳහා 2016 හා 2017 වර්ෂ වලදී ලැබී තිබුණු රු.493 385 ක් 2018 දෙසැම්බර් 11 වන විටත් වැය කර නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘති 04 කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණ ද එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. | සභාවේ අරමුණු හඳුනාගත යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) | අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජුලි 31 දිනැති අංක BD/CBD/4/1/2-2018 චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබුණු දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| (iii) | ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා වූ සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබු බැවින් දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | දත්ත එක්රැස් කිරීමට කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| (iv) | 2016, 2017 හා 2018 වර්ෂවල තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| v) | ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයන් නොපැවති අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | පුහුණු කටයුතු නිසි පරිදි සිදුකළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු. 6,390,000 ක්වූ කැබ් රථයක් 2015 වර්ෂයේ දී අනතුරට ලක් වීම හේතුවෙන් පූර්ණ හානියට පත් වී තිබුණු අතර රක්ෂණ ප්‍රතිලාභ ලෙස 2016 අගෝස්තු 26 දින ලද රු.3,390,000ක මුදල ජංගම ගිණුමේ දිගින් දිගටම නිශ්කාර්යව රඳවා තිබුණි. වාහනය සඳහා පූර්ණ වන්දිය ලෙස ලැබිය යුතු ඉතිරි රු.3,000,000 ක මුදල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් 2019 අප්‍රේල් 18 වන විටත් ලබාගෙන නොතිබුණ අතර අනතුර සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක්ද මෙතෙක් සිදුකර නොතිබුණි. | රක්ෂණ මුදල් ලබාගැනීමට හා අනතුර සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකළ යුතුවේ. | පූර්ණ ආවරණය ලබාගැනීමට කටයුතු සලසා දෙන ලෙස පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. |
| (ආ) | රු.436,928 ක වටිනාකම වූ ලැප්ටොප් පරිගණකයක් හා කොඩිකණු 326 ක ඌනතාවයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කොඩි කණු 326 ක ඌණතාව ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන අතර ලැප්ටොප් පරිගණකය සම්බන්ධයෙන් ඉදිරියේදී මහා සභාවට ඉදිරි පත්කර ඒ අනුව කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ද්විතියික කාර්ය මණ්ඩල පුරප්පාඩු 10 ඇතුළුව අනුමත කාර්ය මණ්ඩලයේ 27 දෙනෙකුගේ පුරප්පාඩුව පැවතීම, | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු තනතුරු සඳහා |

| | | | |
|---|---|---|---|
| | උප කාර්යාල 02 ක් පුස්තකාල 04, ආදාහනාගාරයක් හා නාගරික ප්‍රදේශයක් සහිත ප්‍රාදේශීය සභාවක් ලෙස හිගුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීමට බාධාවක් වී තිබුණි. | | සේවකයින් අනුමත කරගැනීමට කටයුතු කරමි. |
| (ආ) | පුස්තකාල සේවාව සඳහා කාලීන අවශ්‍යතා අනුව සභාව වෙත කාර්යමණ්ඩලය හඳුනාගෙන අනුමත කරවා නොගැනීම හේතුවෙන් පාඨක පැමිණීමේ දුර්වල ප්‍රගතියක් පැවතුණි. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනියුක්ත කර සේවා ලාභීන්ට උපරිම සේවාවක් සැපයිය යුතුවේ. | පුරප්පාඩු තනතුරු සඳහා සේවකයින් අනුමත කරගැනීමට කටයුතු කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිගමනය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගිවිසුමකින් තොරව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ලබා දී ඇති ගොඩනැගිල්ලකින් කුලී මුදල් අයකරගෙන නොතිබුණු අතර ඊට පෙර පළාත් කෘෂිකර්ම කාර්යාලය සඳහා ලබාදීමෙන් හිග හිටව තිබූ රු.128 865ක හිග ජල හා විදුලි බිල්පත් මුදල්ද මෙතෙක් අයකරගෙන නොතිබුණි. | ගිවිසුම්ගත වී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් හිගුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණ භූමියේ ඉදිකරන ලද නීතිඥ කාර්යාල කාමර 16 ක් සඳහා අයකරගත යුතු තිබූ ටෙන්ඩර් ගාස්තු රු.3,465,325 ක් හා මාසිකව අයකරගත යුතුව තිබූරු. 624,000 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මේ පිළිබඳව අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව සතු වත්කම් අයිතම 05 ක් වර්ෂ 02 හා වර්ෂ 05 ට වැඩි කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතුවේ. | මේ පිළිබඳව අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |

3.5 කොන්ත්‍රාත් පාලනය

---------------------------

උතුරුමැද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග 06 ක් සංවර්ධනය කිරීමේදී සහතික කරන බිල්පත් හා ඉදිකිරීම් භෞතික පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු පැවතුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මාර්ග 06 කට අන්තර්බන්ධිත ගල් ඇල්ලීමට අදාලව ගෙවීම් කිරිම සඳහා සහතික කර තිබූ බිල්පත් අනුව රු.234,677 ක් වැඩිපුර සහතික කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අත රැඳවුම් මුදල් මේ වන විට නිදහස් කර නොමැති බැවින් බිල්පතේ සඳහන් ආකාරයට සංවර්ධන කටයුතු සිදුකිරීමෙන් අනතුරුව අත රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරමි. |
| (ii) | මාර්ග 02 කට අදාලව ගෙවීම් කිරීම සඳහා සහතික කර තිබූ බිල්පත්වල සත්‍ය දිග ප්‍රමාණයට වඩා මීටර් 15.5 ක් අඩුවෙන් ඉදිකර තිබීම නිසා වැඩිපුර ගෙවීමට සහතික කර තිබූ මුදල රු. 140,724 ක් විය. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අත රැඳවුම් මුදල් මේ වන විට නිදහස් කර නොමැති බැවින් බිල්පතේ සඳහන් ආකාරයට සංවර්ධන කටයුතු සිදුකර වීමෙන් අනතුරුව අත රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරමි. |
| (iii) | එක් මාර්ගයක පැති බැම්ම ඉදිකිරීම සඳහා ගෙවීමට වැඩිපුර සහතික කර තිබූ මුදල රු. 99,232 ක් විය. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | වැඩිපුර සහතික කර තිබූ රු.99,232 ක මුදල අඩුකර අත රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරමි. |

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දෙන නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |